# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2327/23 - 2023 අප්‍රේල් මස 11 වැනි අඟහරුවාදා - 2023.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

මැතිවරණ කොමිෂන් සභාව සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව මවිසින් පහත උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ නාමයෝජනා කැඳවීමේ දැන්වීම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 26 වැනි වගන්තිය ප්‍රකාරව 2023 ජනවාරි 04 වැනි දින ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව ජනවාරි 18 වැනිදා සිට 21 වැනිදා මධ්‍යාහ්න 12 දක්වා නාමයෝජනා භාරගත් බව ද,

ඉන් අනතුරුව එකී පනතේ 38(1) උපවගන්තිය යටතේ 2023 මාර්තු මස 09 වැනි දිනය ඡන්ද විමසීම් දිනය වශයෙන් නම් කර අංක 2317/17 හා 2023 ජනවාරි මස 30 වැනි දින *අති විශෙෂ ගැසට්* පත්‍රයක් මා විසින් නිකුත් කරන ලද බව ද,

එකී ඡන්ද විමසීම් ඉහත සඳහන් දිනයේදී පැවැත්වීමට අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කිරීමට නොහැකි වූ බවට වූ අනපේක්ෂිත කරුණු හේතු කොට ගෙන මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් විමසීමෙන් අනතුරුව ඉහත සඳහන් පනතේ 38(3) උපවගන්තිය ප්‍රකාරව මවිසින් එම ඡන්ද විමසීමේ දිනය සඳහා වෙනත් දිනයක් ලෙස 2023 අප්‍රේල් මස 25 වැනි දින නියම කරමින් අංක 2322/43 හා 2023 මාර්තු මස 08 වැනි දින *අති විශෙෂ ගැසට්* පත්‍රයක් මා විසින් නිකුත් කර ඇති බව ද,

ඡන්ද විමසීම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් නිකුත් කිරීමට නොහැකි වූ බවට වූ කරුණු තවදුරටත් විසඳී නොමැති හෙයින් ඉහත සඳහන් නියමිත දින ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි තත්ත්වයක් ඇති වී ඇති බැවින් එකී ඡන්ද විමසීම් නැවත වරක් කල් දැමීමට සිදු වී ඇති හෙයින් ද,

තවදුරටත් මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් විමසීමෙන් අනතුරුව ඡන්ද විමසීම් පැවැත්වීමට අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බවට නිශ්චිත වශයෙන් කොමිෂන් සභාවට දැනුම් දෙනු ලබන දිනය හෝ දැනටමත් මෙම ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි විභාග වෙමින් පවත්නා පෙත්සම් සම්බන්ධයෙන් දෙනු ලබන නඩු තීන්දු මත ඡන්ද විමසීම් සඳහා නව දිනයක් නම් කිරීමට සිදු වන්නේ නම් එකී දිනය හෝ යන දින දෙක අතරින් ප්‍රථමයෙන් එළඹෙන දිනයේදී පහත උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා දිනයක් නම් කිරීමට කටයුතු කරනු ලබන බව අම්පාර දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරි ජේ.එම්.ඒ.ඩග්ලස් වන මා විසින් මෙයින් දන්වා සිටිමි.

ජේ.එම්.ඒ.ඩග්ලස්,
තේරීම්භාර නිලධාරි,
අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය.

2023 අප්‍රේල් මස 11 වැනි දින,
අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

1A - G 39346 — 16 (2023/04)
මෙම අති විශෙෂ *ගැසට්* පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

අක්කරෙයිපත්තුව මහා නගර සභාව
අම්පාර නගර සභාව
දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව
දමන ප්‍රාදේශීය සභාව
උහන ප්‍රාදේශීය සභාව
මහඔය ප්‍රාදේශීය සභාව
නාමල්ඔය ප්‍රාදේශීය සභාව
පදියතලාව ප්‍රාදේශීය සභාව
නාවිතාන්වේලි ප්‍රාදේශීය සභාව
සම්මන්තුර ප්‍රාදේශීය සභාව
ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව
අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව
පොතුවිල් ප්‍රාදේශීය සභාව
අඩ්ඩාලච්චේනෙයි ප්‍රාදේශීය සභාව
ආලයඩිවෙම්බු ප්‍රාදේශීය සභාව
ලාහුගල ප්‍රාදේශීය සභාව
කාරෙයිතිව් ප්‍රාදේශීය සභාව
නින්දවූර් ප්‍රාදේශීය සභාව
තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව.

EOG 04 - 0112

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.